අංශයේ පඩි වැඩිවීම නිසා පඩිපාලක සභා කර්මාන්තයන්හි නියුතු සේවකයින්ගේ මූර්ත වැටුප් සියයට 1.5 කින් වැඩි වුණි. කෘෂිකර්මාන්තයේ සේවකයන්ටම පමණක්, සියයට 7.6 ක් මූර්ත වැටුප් වැඩි වීමක් සිදුවිය. 1984 දී කර්මාන්ත හා වාණිජ සහ සේවා අංශයේ නියුතු සේවකයින්ගේ මූර්ත වැටුප් පිළිවෙලින් සියයට 11.6 කින් හා 13.6 කින් පහත වැටුණි.

## වෙළෙඳාම

1984 වසරේදී විදේශ වෙළෙඳාමේ කැපී පෙනෙන වර්ධනයක් ඇති වූයේ තේ සඳහා වූ විදේශ මිළ අධික ලෙස ඉහළ යාමත්, රබර් සහ පොල් සඳහා සාපේක්ෂ වශයෙන් හොඳ මිළක් ලැබීමත්, කාර්මික අපනයනයන්ගෙන් ලත් ඉපැයීම් සැලකිය යුතු ලෙස වර්ධනය වීමත් නිසාය. අපනයන ඉපැයීම් 1984 දී විගැහි වටිනාකම් අනුව සියයට 44 කින් වැඩි වූ අතර පෙර වසරේ වර්ධනය සියයට 7 ක් පමණ විය.

ආනයන වියදම 1984 දී වැඩි වූයේ විගැහි වටිනාකම් අනුව සියයට 0.6 ක තරම් සුළු ප්‍රමාණයකින් වූ අතර 1983 දී එය සියයට 1 කින් පහත වැටී තිබුණි. පාරිභෝජන භාණ්ඩ ආනයන වටිනාකම සියයට 8 කින් අඩු වූ අතර, පොහොර සඳහා වැඩි වියදමක් දැරීමට වූ නිසා අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 5 කින් වැඩි විය. ආයෝජන භාණ්ඩ ආනයන සියයට 3 කින් අඩු වුව ද, එය 1983 දී නැව් සහ ගුවන්යානා ආනයනය සඳහා විශාල වියදමක් දැරීම පිළිබිඹු කරන්නක් විය. ඇත්ත වශයෙන්ම, නැව් සහ ගුවන්යානා හැර අනෙකුත් ආයෝජන භාණ්ඩ ආනයන වියදම 1984 දී සියයට 4 කින් වැඩි විය.

**1.29 සංඛ්‍යා සටහන**

**වෙළෙඳ තුලනය 1982 – 1984**

රුපියල් දශ ලක්ෂ
(විගැහි දශ ලක්ෂ වරහන් තුළ)

| වර්ෂය | ආනයන (අ) | | අපනයන (ඇ) | | වෙළෙඳ තුලනය | |
|---|---|---|---|---|---|---|
| | රේගු | ගලපන ලද(ඇ) | රේගු | ගලපන ලද | රේගු | ගලපන ලද |
| 1982 | 36,876<br>(1,605) | 41,946<br>(1,826) | 21,124<br>(919) | 21,454<br>(934) | –15,751<br>(–686) | –20,492<br>(–892) |
| 1983 | 42,021<br>(1,670) | 45,558<br>(1,811) | 25,183<br>(1,001) | 25,096<br>(998) | –16,838<br>(–669) | –20,461<br>(–813) |
| 1984(ආ) | 46,913<br>(1,799) | 47,541<br>(1,823) | 37,005<br>(1,419) | 37,347(ඇ)<br>(1,432) | – 9,908<br>(–380) | –10,194)<br>(–391) |

(අ) සන රන් හා කාසි ඇතුළත් නොවේ.
(ආ) තාවකාලිකයි.
(ඇ) රේගු වාර්තාවේ සඳහන් නොවූ නැව් සහ ගුවන් යානා වටිනාකම් ඇතුලත්ය.
(ඇ) ප්‍රති අපනයන ඇතුළත් වේ.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව,
ආහාර දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන ආනයන කරුවෝ,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
රාජ්‍ය මැණික් සංස්ථාව,
සීමාසහිත එයාර් ලංකා,
ලංකා නැව් සංස්ථාව.

ආනයන, ඒවායේ උපයෝජනය අනුව වර්ග කළ විට පෙනෙනුයේ පාරිභෝජන භාණ්ඩ සඳහා වූ කොටස 1983 දී සියයට 26 ක් ව තිබී 1984 දී සියයට 23 ක් දක්වා අඩුවී ඇති බවයි. ඒ අතර, අන්තර් භාණ්ඩවල කොටස සියයට 48 සිට සියයට 50 දක්වා වැඩි විය. ආයෝජන භාණ්ඩවල කොටස සියයට 27 සිට සියයට 26 දක්වා සුළු අඩුවීමක් පෙන්විය.

අපනයනයන්හි ඉහළ වර්ධන අනුපාතිකය සහ ආනයනයන්හි සුළු වර්ධන අනුපාතිකය 1984 වසරෙහි ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂයේ හිඟය සැලකිය යුතු ලෙස අඩුවීමට හේතු විය. රේගු වාර්තා අනුව, ආනයන රුපියල් 4,691 කෝටි 30 ලක්ෂයක් (විගැහි 179 කෝටි 90 ලක්ෂයක්) සහ අපනයන රුපියල් 3,700 කෝටි 50 ලක්ෂයක් (විගැහි 141 කෝටි 90 ලක්ෂයක්) වූ අතර, වෙළෙඳ හිඟය රුපියල් 990 කෝටි 80 ලක්ෂයක් (විගැහි 38 කෝටියක්) විය. මෙය පෙර වසරේ වෙළෙඳ හිඟය වූ රුපියල් 1,683 කෝටි 80 ලක්ෂය (විගැහි 66 කෝටි 90 ලක්ෂය) සමග සසඳන විට සියයට 43 ක අඩුවීමකි. රේගු සංඛ්‍යා, වාර්තාවීමේ කල් පමා ආදී දෑ සඳහා ගලපනු ලැබූ කළ ආනයන වටිනාකම රුපියල් 4,754 කෝටි 10 ලක්ෂයක් (විගැහි 182 කෝටි 30 ලක්ෂයක්) වූ අතර, අපනයන ඉපැයීම් රුපියල් 3,734 කෝටි 70 ලක්ෂයක් (විගැහි 143 කෝටි 20 ලක්ෂයක්) විය. එමනිසා ගලපන ලද සංඛ්‍යා අනුව පෙනෙන වෙළෙඳ හිඟය 1984 දී රුපියල් 1,019 කෝටි 40 ලක්ෂයක් (විගැහි 39 කෝටි 10 ලක්ෂයක්) විය. මෙය පෙර වසරේ රුපියල් 2,046 කෝටි 10 ලක්ෂයක (විගැහි 81 කෝටි 30 ලක්ෂයක) හිඟය සමග සසඳන විට සියයට 52 ක අඩුවීමකි.

**1·30 සංඛ්‍යා සටහන**

**විදේශීය වෙළෙඳාම 1975 – 1984**

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | දර්ශක අංක 1978=100 | | | | වෙළෙඳ අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | පරිමාව | | මිළ | | |
| | අපනයන (නැ.වි.ස.) | ආනයන (මි.ර.ගැ.) | වෙළෙඳ තුලනය | සියළුම අපනයන | සියළුම ආනයන | සියළුම අපනයන | සියළුම ආනයන | |
| 1975 | 3,933 | 5,251 | – 1,318 | 107 | 52 | 29 | 49 | 58 |
| 1976 | 4,815 | 4,645 | + 170 | 102 | 57 | 34 | 44 | 78 |
| 1977 | 6,638 | 6,007 | + 631 | 94 | 73 | 55 | 54 | 102 |
| 1978 | 13,206 | 14,687 | – 1,481 | 100 | 100 | 100 | 100 | 100 |
| 1979 | 15,273 | 22,560 | – 7,287 | 101 | 123 | 109 | 152 | 72 |
| 1980 | 17,595 | 33,942 | – 16,347 | 99 | 140 | 126 | 217 | 58 |
| 1981 | 21,043 | 36,582 | – 15,539 | 102 | 145 | 129 | 282 | 46 |
| 1982 | 21,454 | 41,946 | – 20,492 | 112 | 150 | 119 | 309 | 38 |
| 1983 | 25,096 | 45,558 | – 20,461 | 109 | 180 | 165 | 375 | 44 |
| 1984(අ) | 37,347 | 47,541 | – 10,194 | 127 | 185 | 207 | 415 | 50 |

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලික.
1980 සිට ඉදිරියට ගලපන ලදි.

ආනයන සහ අපනයන මිළ ගණන් වල සාපේක්ෂ වෙනස්වීම් මගින් ශ්‍රී ලංකාවේ වෙළෙඳ අනුපාතය, 1984 වසරේදී තව දුරටත් වාසිදායක තත්ත්වයකට පත් කළේය. අපනයන මිළ දර්ශකය අනුව අපනයන මිළ සියයට 25 කින්ද ආනයන මිළ දර්ශකය අනුව ආනයන මිළ සියයට 11 කින් ද වැඩි වූ අතර එම වැඩිවීම් 1983 දී පිළිවෙළින් සියයට 39 ක් සහ සියයට 21 ක් විය. මෙම වාසිදායක තත්ත්වයන් 1983 දී සියයට 16 කින් වර්ධනය වූ වෙළෙඳ අනුපාතය තව දුරටත් 1984 දී සියයට 14 කින් වර්ධනය වීමට හේතු විය.

**අපනයන**

අපනයන ඉපැයීම් (ගලපන ලද දත්ත) 1983 දී රුපියල් 2,509 කෝටි 60 ලක්ෂයේ (විගැහි 99 කෝටි 80 ලක්ෂය) සිට 1984 දී රුපියල් 3,734 කෝටි 70 ලක්ෂය (විගැහි 143 කෝටි 20 ලක්ෂය) දක්වා වැඩි විය. මේ අනුව, 1984 අපනයන ඉපැයීම් වර්ධන අනුපාතිකය රුපියල් වටිනාකම් අනුව සියයට 49 කින් සහ විගැහි අනුව සියයට 44 කින් වර්ධනය වූ අතර, 1983 එම වර්ධනයන් පිළිවෙළින් සියයට 17 ක් සහ සියයට 7 ක් විය. සුළු කෘෂිකාර්මික භෝග සහ මැණික් හැරුණු විට 1984 දී අනෙකුත් සියළුම අපනයන කාණ්ඩයන්හි ඉපැයීම් වැඩි විය. කෙසේ

## 1.31 සංඛ්‍යා සටහන
## 1982–1984 අපනයන සංයුතිය

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැති දශ ලක්ෂ | | | මුළු අපනයන වල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1982 | 1983 | 1984(ඈ) | 1982 | 1983 | 1984 | 1982 | 1983 | 1984 |
| 1. කෘෂිකාර්මික අපනයන .. | 11,656 | 14,554 | 22,542 | 507 | 579 | 864 | 54·3 | 58·0 | 60·3 |
| 1·1 තේ .. | 6,342 | 8,295 | 15,764 | 276 | 330 | 604 | 29·6 | 33·1 | 42·2 |
| 1·2 රබර් .. | 2,323 | 2,852 | 3,301 | 101 | 114 | 127 | 10·8 | 11·4 | 8·8 |
| 1·3 පොල් .. | 1,496 | 1,921 | 2,118 | 65 | 76 | 81 | 7·0 | 7·6 | 5·7 |
| 1·3·1 පොල් මද නිෂ්පාදිත .. | 1,003 | 1,409 | 1,553 | 44 | 56 | 59 | 4·7 | 5·6 | 4·2 |
| 1·3·2 වෙනත් .. | 494 | 512 | 565 | 21 | 20 | 22 | 2·3 | 2·0 | 1·5 |
| 1·4 සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත(අ) .. | 1,495 | 1,486 | 1,358 | 65 | 59 | 52 | 6·9 | 5·9 | 3·6 |
| 2. කාර්මික අපනයන(අ)(ආ) .. | 8,271 | 8,821 | 12,591 | 360 | 351 | 483 | 38·6 | 35·1 | 33·7 |
| 2·1 රෙදිපිළි හා ඇඟලුම් .. | 3,502 | 4,738 | 7,535 | 152 | 188 | 289 | 16·3 | 18·9 | 20·2 |
| 2·2 ඛනිජ තෙල් නිෂ්පාදිත .. | 3,280 | 2,682 | 3,288 | 143 | 107 | 126 | 15·3 | 10·6 | 8·8 |
| 2·3 වෙනත් .. | 1,489 | 1,401 | 1,768 | 65 | 56 | 68 | 7·0 | 5·6 | 4·7 |
| 3. ඛණිජමය අපනයන .. | 859 | 1,132 | 832 | 37 | 45 | 32 | 4·0 | 4·5 | 2·2 |
| 3·1 මැණික් .. | 685 | 940 | 617 | 30 | 37 | 24 | 3·2 | 3·7 | 1·6 |
| 3·2 වෙනත් .. | 174 | 192 | 215 | 7 | 8 | 8 | 0·8 | 0·8 | 0·6 |
| 4. වර්ග නොකළ අපනයන (ඇ) .. | 668 | 589 | 1,382(ඉ) | 30 | 23 | 53 | 3·1 | 2·4 | 3·7 |
| මුළු අපනයන(ආ) | 21,454 | 25,096 | 37,347 | 934 | 998 | 1,432 | 100·0 | 100·0 | 100·0 |

(අ) විශාල පරිමාවක් ආවරණය වන පරිදි තෝරාගත් අයිතමයන් සංශෝධනය කර ඇත.
(ආ) ගලපන ලදී.
(ඇ) ප්‍රති-අපනයන ඇතුළත්ය.
(ඈ) තාවකාලික.
(ඉ) ගුවන් යානාවක් අපනයනය කිරීම ඇතුළත්වේ.

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
රාජ්‍ය මැණික් සංස්ථාව,
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව.

පරිවර්තනතාවය :
1982 විගැති 1 = රුපියල් 22·98
1983 විගැති 1 = රුපියල් 25·16
1984 විගැති 1 — රුපියල් 26·08

වුව ද, වැවිලි භෝග සහ කාර්මික අපනයනවලින් ලත් ඉපැයීම් 1983 ට වඩා පිළිවෙළින් සියයට 62 කින් (විගැහි අනුව සියයට 56 කින්) සහ සියයට 43 කින් (විගැහි අනුව සියයට 38 කින්) ඉහළ යාම සමස්ථ අපනයන වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. වැවිලි භෝගවල ඉපැයීම් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුළු අපනයන ඉපැයීම් වලින් කෘෂිකාර්මික අපනයනයන්ගේ ප්‍රමාණය 1983 දී සියට 58 සිට 1984 දී සියයට 60 දක්වා ඉහළ නැගුණි. මෙය වැඩි වූයේ සුළු කෘෂිකාර්මික භෝග වලින් ලද ඉපැයීම් වල පහත වැටීමක් ද තිබියදී ය. කාර්මික අපනයන වලින් ලත් ඉපැයීම් නිරපේක්ෂව සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි වුව ද, එහි සාපේක්ෂ කොටස 1983 දී සියයට 35 සිට 1984 දී සියයට 34 දක්වා පහත වැටුණි. කාර්මික අපනයනවල සාපේක්ෂ කොටස පහත වැටීම සම්පූර්ණයෙන්ම වැවිලි භෝගවලින් ලත් ඉහළ අපනයන ඉපැයීම් පිළිබිඹු කරන්නක් විය. මැණික් අපනයන ඉපැයීම් අඩුවීම හේතු කොටගෙන ඛනිජමය අපනයනයන්ගෙන් ලත් අපනයන ඉපැයීම් නිරපේක්ෂ හා සාපේක්ෂ යන දෙයාකාරයෙන් ම පහත වැටුණි.

1984 දී ප්‍රධාන වැවිලි භෝග තුනෙහි අපනයන ක්‍රියාකාරිත්වය ඉතා විශිෂ්ඨ විය. තේ, රබර් සහ පොල් වලින් ලද ඉපැයීම් පිළිවෙළින් ඉකුත් වසරට වඩා සියයට 90 කින් (විගැහි අනුව සියයට 83 කින්), සියයට 16 කින් (විගැහි අනුව සියයට 12 කින්) සහ සියයට 10 කින් (විගැහි අනුව සියයට 6 කින්) ඉහළ නැගුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු අපනයන ඉපැයීම්වලින් මෙම භෝගවල කොටස 1983 දී වූ සියයට 52 සිට 1984 දී සියයට 57 දක්වා ඉහළ නැගුණි. තේ අපනයනවල පමණක් දායකත්වය 1983 දී වූ සියයට 33 සිට 1984 දී සියයට 42 දක්වා වැඩි විය. කෙසේ වුව ද, සුළු කෘෂිකාර්මික අපනයන අංශයෙහි ක්‍රියාකාරිත්වය අසතුටුදායක විය. මෙම අපනයන, 1983 දී රුපියල් හා විගැහි යන දෙයාකාරයෙන් ම පහත වැටුණු අතර, 1984 දී තව දුරටත් අඩුවීමක් වාර්තා කරන ලදී.

1984 දී කාර්මික අපනයනයන්හි විශාල වර්ධනයක් විය. මෙම කාණ්ඩයට අදාළ විශාලතම අයිතමය වන රෙදිපිළි හා ඇඟලුම්වලින් ලත් ඉපැයීම්, 1983 දී වූ සියයට 35 ක (විගැහි අනුව සියයට 24 ක) වැඩිවීම හා සසඳන විට 1984 දී සියයට 59 කින් (විගැහි අනුව සියයට 54 කින්) වැඩි විය. එසේම, 1983 දී පහත වැටුන ඛනිජ තෙල් හා අනෙකුත් කාර්මික නිෂ්පාදිත යන දෙඅංශයෙහිම ඉපැයීම් 1984 දී පිළිවෙළින් සියයට 23 කින් (විගැහි අනුව පියයට 18 කින්) සහ සියයට 26 කින් (විගැහි අනුව සියයට 21 කින්) කැපී පෙනෙන ලෙස ඉහළ නැගුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉකුත් වසරේ සියයට 3 කින් පහත වැටුන කාර්මික අපනයනයන්ගෙන් ලද මුළු ඉපැයීම් 1984 දී විගැහි අනුව සියයට 38 කින් වැඩි විය.

ඛනිජමය අපනයනයන්ගෙන් ලත් මුළු ඉපැයීම් 1983 දී රුපියල් 113 කෝටි 20 ලක්ෂයේ (විගැහි 4 කෝටි 50 ලක්ෂය) සිට 1984 දී රුපියල් 83 කෝටි 20 ලක්ෂය (විගැහි 3 කෝටි 20 ලක්ෂය) දක්වා සියයට 27 කින් (විගැහි අනුව සියයට 29 කින්) පහත වැටුණි. මෙයට මුළුමනින්ම හේතු වූයේ මැණික් අපනයන වටිනාකම 1983 දී රුපියල් 94 කෝටියේ (විගැහි 3 කෝටි 70 ලක්ෂය) සිට 1984 දී රුපියල් 61 කෝටි 70 ලක්ෂය (විගැහි 2 කෝටි 40 ලක්ෂය) දක්වා පහත වැටීමයි. කෙසේ වුවද, මෙම පහත වැටීමෙන් කොටසක් 1983 දී වෙනත් ඛනිජමය අපනයනයන් ඉපයන ලද රුපියල් 19 කෝටි 20 ලක්ෂයේ (විගැහි 80 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 21 කෝටි 50 ලක්ෂය (විගැහි 80 ලක්ෂය) දක්වා ඉහළ යාම මගින් සමහන් විය.

1984 දී වූ තේ අපනයන වටිනාකම 1983 ට වඩා රුපියල් 746 කෝටි 90 ලක්ෂයක (විගැහි 27 කෝටි 50 ලක්ෂයක) වැඩිවීමක් පෙන්වමින් රුපියල් 1,576 කෝටි 40 ලක්ෂයක් (විගැහි 60 කෝටි 40 ලක්ෂයක්) විය. අපනයන සැපයුම අඩුවීම හා විශේෂයෙන්ම නිෂ්පාදිත රටවල පාරිභෝජනය ඉහළ යාමද හේතුකොටගෙන, 1983 මැද භාගයේදී ඇරඹුන ජාත්‍යන්තර තේ මිළ ඉහළ යාම 1984 දී ද අඛණ්ඩව පැවතුනි. තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය නැ.වි.ස. මිළ 1983 රුපියල් 52.52 (විගැහි 2.09) සිට 1984 රුපියල් 77.20 (විගැහි 2.96) දක්වා සියයට 47 කින්

(විගැහි අනුව සියයට 42 කින්) වැඩි විය. ඒ සමගම කොළඹ වෙන්දේසියේ අලෙවි කළ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය දළ මිළ රුපියල් 43.27 සිට රුපියල් 62.79 දක්වා සියයට 45 කින් වැඩි විය. මෙය, ලන්ඩන් වෙන්දේසියේ දී ශ්‍රී ලංකාවේ තේ කිලෝග්‍රෑමයකට 1983 දී ලැබුනු පැන්ස 153.40 මිළ 1984 දී පැන්ස 247.41 දක්වා සියයට 61 කින් ඉහළ යාම හා සැසඳිය හැකිය.

කොළඹ වෙන්දේසියේ අලෙවි කළ තේ පරිමාව 1983 දී කිලෝග්‍රෑම් 16 කෝටි 70 ලක්ෂයේ සිට 1984 දී කිලෝග්‍රෑම් 20 කෝටි 30 ලක්ෂය දක්වා සියයට 22 කින් ඉහළ නැගුණි. ලන්ඩන් වෙන්දේසියේ අලෙවි කළ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය ද කිලෝග්‍රෑම් 16 ලක්ෂයේ සිට 26 ලක්ෂය දක්වා ඉහළ නැගුණි. 1984 දී තේ අපනයන ප්‍රමාණය වැඩිවීම මෑත අවුරුදු වල දක්නට ලැබුණු අපනයන අඩුවීමේ ප්‍රවණතාවය ආපසු හැරවීමක් පෙන්නුම් කරන්නකි. එසේ වුව ද, එය 1975 අපනයනය කරන ලද ඉහළම ප්‍රමාණය වූ කිලෝග්‍රෑම් 21 කෝටි 30 ලක්ෂය හා සසඳන විට පහත් මට්ටමක් පෙන්නුම් කරයි.

රබර් අපනයනයන්ගේ වටිනාකම 1983 දී රුපියල් 285 කෝටි 20 ලක්ෂයේ (විගැහි 11 කෝටි 40 ලක්ෂය) සිට 1984 දී රුපියල් 330 කෝටි 10 ලක්ෂය (විගැහි 12 කෝටි 70 ලක්ෂය) දක්වා සියයට 16 කින් (විගැහි අනුව සියයට 12 කින්) ඉහළ නැගුණි. සාමාන්‍ය නැ.වි.ස. මිළ 1983 දී කිලෝග්‍රෑමයක් රුපියල් 22.77 සිට 1984 දී කිලෝග්‍රෑමයක් රුපියල් 26.16 දක්වා ඉහළ නැගීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. රබර් අපනයන පරිමාව 1984 දී කිලෝග්‍රෑම් 12 කෝටි 60 ලක්ෂය දක්වා කිලෝග්‍රෑම් ලක්ෂ 10 කින් ඉහළ නැගුණි.

1984 දී සියළුම පොල් නිෂ්පාදන අපනයනවලින් ලත් ඉපැයීම් රුපියල් 211 කෝටි 80 ලක්ෂය (විගැහි 8 කෝටි 10 ලක්ෂය) දක්වා සියයට 10 කින් (විගැහි අනුව සියයට 6 කින්) ඉහළ නැඟුණි. පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයනයන්ගේ ඉහළ යාම 1983 දී රුපියල් 140 කෝටි 90 ලක්ෂයේ (විගැහි 5 කෝටි 60 ලක්ෂය) සිට 1984 දී රුපියල් 155 කෝටි 30 ලක්ෂය (විගැහි 5 කෝටි 90 ලක්ෂය) දක්වා වූ අතර, පොල් අතුරු නිෂ්පාදිත අපනයනයන්ගේ වැඩි වීම රුපියල් 51 කෝටි 20 ලක්ෂයේ (විගැහි 2 කෝටියක) සිට රුපියල් 56 කෝටි 60 ලක්ෂය (විගැහි 2 කෝටි 20 ලක්ෂය) දක්වා විය. කෙසේ වුවද, පොල් මද නිෂ්පාදිතයන්ගේ අපනයන පරිමාව 1983 දී ගෙඩි 58 කෝටි 20 ලක්ෂයේ සිට 1984 දී ගෙඩි 32 කෝටි 70 ලක්ෂය දක්වා තියුණු ලෙස පහත වැටුණි. මෙසේ පොල්මද ආශ්‍රිත නිෂ්පාදිතයන්ගේ ඉහළ ගිය අපනයන ඉපැයීම්වලට මුළුමනින්ම හේතු වූයේ ගෙඩියක සාමාන්‍ය නැ.වි.ස. මිළ 1983 දී රු. 2.42 සිට 1984 දී රු. 4.75 දක්වා වැඩි වීමය.

කෘෂිකාර්මික අපනයන සම්බන්ධව සලකන විට එකම පසුබෑම වූයේ ඉකුත් වසරේදී විගැහි අනුව සියයට 10 කින් පහත වැටුන සුළු කෘෂිකාර්මික අපනයන ඉපැයීම් තව දුරටත් සියයට 12 කින් පහත වැටීමයි. එම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කරාබු නැටි, එළවළු, තල ඇට, කජු සහ වාෂ්පශීලී තෙල් වලින් ලද ඉපැයීම්වල අඩු වීමයි.

1983 දී රුපියල් 882 කෝටි 10 ලක්ෂය (විගැහි 35 කෝටි 10 ලක්ෂය) ක් වූ කාර්මික අපනයන වටිනාකම, 1984 දී රුපියල් 1,259 කෝටි 10 ලක්ෂයක් (විගැහි 48 කෝටි 30 ලක්ෂයක්) දක්වා සියයට 43 කින් (විගැහි අනුව සියයට 38) වර්ධනය විය. මෙම දෙවර්ෂය අතරතුර රෙදි-පිළි සහ ඇඟලුම් අපනයනයන්ගේ ඉපැයීම් රුපියල් 473 කෝටි 80 ලක්ෂයේ (විගැහි 18 කෝටි 80 ලක්ෂයේ) සිට රුපියල් 753 කෝටි 50 ලක්ෂය (විගැහි 28 කෝටි 90 ලක්ෂය) දක්වා වැඩි වූ අතර, ඛනිජ තෙල් නිෂ්පාදිතයන්ගේ ඉපැයීම් රුපියල් 268 කෝටි 20 ලක්ෂයේ (විගැහි 10 කෝටි 70 ලක්ෂය) සිට රුපියල් 328 කෝටි 80 ලක්ෂය (විගැහි 12 කෝටි 60 ලක්ෂය) දක්වා ඉහළ නැගුණි.

ඇඟලුම් අපනයනයන්ගේ ඉපැයීම්වල ඉහළ යාම, මිළ සහ පරිමාව යන දෙකම වැඩි වීමේ ප්‍රතිඵලයක් විය. මුළු අපනයනවල ඇඟලුම් අපනයනයන්ගේ ප්‍රමාණය 1983 දී සියයට 19 සිට 1984 දී සියයට 20 දක්වා තව දුරටත් වැඩි විය. මහ කොළඹ ආර්ථික කොමිසමෙහි ව්‍යාපාර විසින් 1984 දී කරන ලද ඇඟලුම් අපනයනයන් රුපියල් 268 කෝටි 70 ලක්ෂයක් (විගැහි 10 කෝටි 30 ලක්ෂයක්) ලෙස ඇස්තමේන්තු කර ඇත.

සමස්ථයක් වශයෙන් මෑත කාලීන වර්ෂයන්හි අපනයන අංශයේ වාර්තාගත ඉහළම වර්ධන අනුපාතය මෙය විය. කෙසේ වුවද මීට පෙර වාර්ෂික වාර්තාවන්හි සඳහන් කරන ලද පරිදි, සුළු කෘෂිකාර්මික අපනයනයන්ගේ පහත වැටීමේ ප්‍රවණතාවය සැළකිල්ලට ලක් කළ යුතු කරුණක් වෙයි. මැණික් අපනයන ඉපැයීම්වල තියුණු පහත වැටීම ගැන කිව හැක්කේ ද මෙයමයි.

**ආනයන**

මුළු ආනයන වියදම 1983 දී රුපියල් 4,555 කෝටි 80 ලක්ෂය (විගැහි 181 කෝටි 10 ලක්ෂය) හා සසඳන විට 1984 දී (ගලපන ලද සංඛ්‍යා) රුපියල් 4,754 කෝටි 10 ලක්ෂයක් (විගැහි 182 කෝටි 30 ලක්ෂයක්) විය. මෙසේ, ආනයන වියදම, රුපියල් වටිනාකම අනුව ඉකුත් වසරේදී සියයට 9 කින් වැඩිවීම හා සසඳන විට 1984 දී සියයට 4 කින් ඉහළ නැඟුණි. කෙසේ වුව ද, විගැහි අනුව 1983 දී සියයට 1 ක පහත වැටීම හා සසඳන කල 1984 දී ආනයන සියයට 0.6 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. ආනයනවල මෙම වැඩිවීම සම්පූර්ණයෙන් ඇතිවූයේ අන්තර් භාණ්ඩ වලිනි.

ආනයනයන්ගේ ව්‍යුහමය සංයුතියෙහි පෙර වසරට වඩා සැළකිය යුතු වෙනස්වීම් පෙන්නුම් කෙරුණි. මෙම වසර දෙක අතරතුර මුළු ආනයන වලින් අන්තර් භාණ්ඩවල කොටස 1983 දී සියයට 48 සිට 1984 දී සියයට 50 දක්වා වැඩි වූ අතර, පාරිභෝගික හා ආයෝජන භාණ්ඩයන්ගේ ප්‍රමාණයන් පිළිවෙළින් සියයට 26 සිට 23 දක්වා සහ සියයට 27 සිට 26 දක්වා පහත වැටුණි. පරිභෝගික භාණ්ඩ සඳහා වූ වියදමෙහි පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සහල්, සීනි, කිරි ආහාර හා කල් පවත්නා පරිභෝජන භාණ්ඩයන්ගේ අඩුවීමය.

1984 ආයෝජන භාණ්ඩ ආනයන වියදම රුපියල් වටිනාකම අනුව, 1983 ට වඩා සියයට 1 ක පමණ වැඩිවීමක් පෙන්නුම් කළ නමුත්, විගැහි අනුව සියයට 3 ක පහත වැටීමක් පෙන්නුම් කරමින් රුපියල් 1,217 කෝටියක් (විගැහි 46 කෝටි 70 ලක්ෂයක්) විය. කෙසේ වුවද, නැව් හා ගුවන් යානා ආනයනයන් රහිතව ආයෝජන භාණ්ඩවල වටිනාකම පෙර වසරට වඩා සියයට 7 කින් (විගැහි අනුව සියයට 4 කින්) ඉහළ නැඟුණි. ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ගමනාගමන උපකරණ ආනයන සඳහා වියදම පිළිවෙළින් සියයට 38 කින් (විගැහි අනුව සියයට 40 කින්) සහ සියයට 21 කින් (විගැහි අනුව සියයට 24 කින්) කැපී පෙනෙන ලෙස පහත වැටුන අතර, යන්ත්‍ර සහ උපකරණ ආනයන රුපියල් වටිනාකම අනුව සියයට 1 කින් සුළු වශයෙන් ඉහළ නැඟුණි. වෙනත් ආයෝජන භාණ්ඩ ආනයනයන්, 1983 දී වූ රුපියල් 181 කෝටි 30 ලක්ෂයේ (විගැහි 7 කෝටි 20 ලක්ෂය) සිට 1984 දී රුපියල් 307 කෝටි 70 ලක්ෂය (විගැහි 11 කෝටි 80 ලක්ෂය) දක්වා සියයට 70 කින් (විගැහි අනුව සියයට 64 කින්) කැපී පෙනෙන ලෙස ඉහළ නැඟුණි. ගමනාගමන උපකරණ ආනයනයන් සියයට 21 කින් පහත වැටුණි. මෙම අඩුවීම වූයේ, මෙම කාණ්ඩයේ ආනයනවල වැඩිකිරීමකට හේතු විය හැකිව තිබූ රුපියල් 93 කෝටි 10 ලක්ෂයක් (විගැහි 3 කෝටි 60 ලක්ෂයක්) වටිනා ගුවන්යානා ආනයනයක්ද මේ වසරේ සිදුවී තිබියදීය.

අන්තර් භාණ්ඩ ආනයන වියදම 1983 දී රුපියල් 2,172 කෝටි 70 ලක්ෂයේ (විගැහි 86 කෝටි 40 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 2,392 කෝටි 50 ලක්ෂය (විගැහි 91 කෝටි 70 ලක්ෂය) දක්වා සියයට 10 කින් (විගැහි අනුව සියයට 6 කින්) ඉහළ නැඟුණි. රුපියල් 247 කෝටි 10 ලක්ෂයක් (විගැහි 9 කෝටි 50 ලක්ෂයක්) වූ තිරිඟු ඇට ආනයන වියදම සියයට 6 කින් (විගැහි අනුව සියයට 2 කින්) වැඩි වූ අතර, පිළිවෙළින් රුපියල් 110 කෝටි 30 ලක්ෂයක්

## 1 . 32 සංඛ්‍යා සටහන

## ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව කෙරෙන වර්ගීකරණය 1982 - 1984

| කාණ්ඩය | වටිනාකම | | | | | | මුළු ආනයනවල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | | | |
| | 1982 | 1983(අ) | 1984(ආ) | 1982 | 1983 | 1984 | 1982 | 1983 | 1984 |
| 1. පාරිභෝගික භාණ්ඩ .. .. | 8,616 | 11,639 | 11,052 | 375·0 | 462·7 | 423·8 | 20·5 | 25·5 | 23·2 |
| 1·1 ආහාර සහ බීම වර්ග .. .. | 3,561 | 5,375 | 4,986 | 155·0 | 213·7 | 191·2 | 8·5 | 11·8 | 10·5 |
| 1·1·1 සහල් .. .. | 925 | 765 | 197 | 40·3 | 30·4 | 7·5 | 2·2 | 1·7 | 0·4 |
| 1·1·2 පිටි .. .. | 62 | 108 | 28 | 2·7 | 4·3 | 1·1 | 0·2 | 0·2 | 0·1 |
| 1·1·3 සීනි .. .. | 970 | 1,985 | 1,346 | 42·2 | 78·9 | 51·6 | 2·3 | 4·4 | 2·8 |
| 1·2 රෙදිපිළි සහ ඇඟලුම් .. .. | 2,167 | 2,724 | 2,974 | 94·3 | 108·3 | 114·0 | 5·2 | 6·0 | 6·3 |
| 1·3 වෙනත් .. .. | 2,888 | 3,540 | 3,092 | 125·7 | 140·7 | 118·6 | 6·9 | 7·8 | 6·5 |
| 2. අන්තර් භාණ්ඩ .. .. | 21,640 | 21,727 | 23,749 | 941·8 | 863·7 | 910·7 | 51·6 | 47·7 | 50·0 |
| 2·1 ඛණිජ තෙල් .. .. | 12,274 | 11,024 | 10,681 | 534·2 | 438·2 | 409·6 | 29·3 | 24·2 | 22·5 |
| 2·2 පොහොර .. .. | 560 | 625 | 1,103 | 24·4 | 24·8 | 42·3 | 1·3 | 1·4 | 2·3 |
| 2·3 රසායනික ද්‍රව්‍ය .. .. | 729 | 832 | 1,028 | 31·7 | 33·1 | 39·4 | 1·7 | 1·8 | 2·2 |
| 2·4 කිරිඟු .. .. | 1,787 | 2,340 | 2,471 | 77·8 | 93·0 | 94·8 | 4·3 | 5·1 | 5·2 |
| 3. ආයෝජන භාණ්ඩ .. .. | 11,591 | 12,077 | 12,170 | 504·5 | 480·1 | 466·7 | 27·6 | 26·5 | 25·6 |
| 3·1 යන්ත්‍ර සූත්‍ර හා උපකරණ .. | 3,964 | 5,261 | 5,335 | 172·5 | 209·1 | 204·6 | 9·5 | 11·6 | 11·2 |
| 3·2 ගමනා ගමන උපකරණ(ඇ) .. | 5,529 | 3,826 | 3,031 | 240·6 | 152·1 | 116·2 | 13·2 | 8·4 | 6·4 |
| 3·3 ගොඩනැගිලි ද්‍රව්‍ය .. .. | 557 | 1,177 | 727 | 24·2 | 46·8 | 27·9 | 1·3 | 2·6 | 1·5 |
| 4. වර්ග නොකල ආනයන .. .. | 99 | 115 | 570 | 4·3 | 4·6 | 21·8 | 0·2 | 0·3 | 1·2 |
| මුළු ආනයන (ඈ) .. .. | 41,946 | 45,558 | 47,541 | 1,825·6 | 1,811·1 | 1,823·0 | 100·0 | 100·0 | 100·0 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) රේගු වාර්තාවල සටහන් නොවූ නැව් සහ ගුවන් යානාවල වටිනාකම් ඇතුළත් වේ.
(ඈ) ගලපන ලදී.

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව සහ
වෙනත් ප්‍රධාන පොහොර ආනයන කරුවෝ,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
සීමාසහිත එයාර් ලංකා,
ලංකා නැව් සංස්ථාව.

(විගැහි 4 කෝටි 20 ලක්ෂයක්) සහ රුපියල් 102 කෝටි 80 ලක්ෂයක් (විගැහි 3 කෝටි 90 ලක්ෂයක්) වූ පොහොර සහ රසායන ද්‍රව්‍ය ආනයනයන්ගේ වියදම් ඉකුත් වසරට වඩා පිළිවෙළින් සියයට 76 කින් (විගැහි අනුව සියයට 71 කින්) සහ සියයට 24 කින් (විගැහි අනුව සියයට 19 කින්) ඉහළ නැගුණි. තිරිඟු ඇට ආනයන වියදමෙහි වැඩිවීම මුළුමනින්ම සාමාන්‍ය මී.ර.ගැ. මිළ ගණන් වල වැඩිවීමෙහි ප්‍රතිඵලයක් විය.

ඉකුත් වසරේදී සියයට 10 කින් (විගැහි අනුව සියයට 18 කින්) පහත වැටුන ඛණිජ තෙල් ආනයන වියදම 1983 දී රුපියල් 1,102 කෝටි 40 ලක්ෂයේ (විගැහි 43 කෝටි 80 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 1,068 කෝටි 10 ලක්ෂය (විගැහි 41 කෝටිය) දක්වා සියයට 3 කින් (විගැහි අනුව සියයට 7 කින්) තවදුරටත් පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම වසර දෙක අතරතුර මුළු අන්තර් භාණ්ඩ ආනයනයෙන් ඛනිජ තෙල් ආනයනයන්ගේ ප්‍රමාණය සියයට 51 සිට සියයට 45 දක්වා පහත වැටුණි. ඛනිජ තෙල් ආනයන වියදම්වල පහත වැටීමට හේතු-වූයේ අඩු මිළ ගණන් සහ පිරිසිදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනයන්ගේ අඩු වීමය.

1983 දී සියයට 35 කින් (විගැහි අනුව සියයට 23 කින්) ඉහළ ගිය පාරිභෝජන භාණ්ඩ ආනයන වියදම රුපියල් 1,163 කෝටි 90 ලක්ෂයේ (විගැහි 46 කෝටි 30 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 1,105 කෝටි 20 ලක්ෂය (විගැහි 42 කෝටි 40 ලක්ෂය) දක්වා සියයට 5 කින් (විගැහි අනුව සියයට 8 කින්) පහත වැටුණි. ආහාර පාන (සහල්, සීනි සහ කිරි ආහාර ද්‍රව්‍ය) සහ ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී ඇතුළත් අනෙක් පාරිභෝගික භාණ්ඩයන් සඳහා වූ වියදමෙහි අඩුවීම මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. පරිමාව සහ මිළ යන දෙකෙහිම පහත වැටීම හේතුකොටගෙන, සීනි ආනයනය සඳහා වියදම 1983 දී රුපියල් 198 කෝටි 50 ලක්ෂයේ (විගැහි 7 කෝටි 90 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 134 කෝටි 60 ලක්ෂය (විගැහි 5 කෝටි 20 ලක්ෂය) දක්වා සියයට 33 කින් (විගැහි අනුව සියයට 35 කින්) තියුණු ලෙස පහත වැටුණි. කෙසේ වුව ද, රෙදිපිළි සහ ඇඟලුම් ආනයන වටිනාකම 1983 දී රුපියල් 272 කෝටි 40 ලක්ෂයේ (විගැහි 10 කෝටි 80 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 297 කෝටි 40 ලක්ෂය (විගැහි 11 කෝටි 40 ලක්ෂය) දක්වා සියයට 9 කින් (විගැහි අනුව සියයට 5 කින්) ඉහළ නැගුණි. ඇඟලුම් කර්මාන්තවල උපයෝජනය සඳහා ආනයනයන් ඉහළ යාම මෙයින් පිළිබිඹු විය.

**1 . 33 සංඛ්‍යා සටහන**

**1984-ප්‍රධාන ආනයනයන්හි පරිමාව**

මෙට්‍රික් ටොන්

| මාසය | සහල් | තිරිඟු | සීනි | ඛනිජ තෙල් (බොර තෙල්) | පොහොර |
|---|---|---|---|---|---|
| ජනවාරි .. | 14,123 | 60,763 | 4,162 | 126,221 | 40,211 |
| පෙබරවාරි .. | 4 | — | 10,841 | 155,734 | 5,700 |
| මාර්තු .. | 12,405 | 63,600 | 27,600 | 158,038 | 32,134 |
| අප්‍රේල් .. | 15 | 61,341 | 16,430 | 157,544 | 25,423 |
| මැයි .. | 8,036 | 85,826 | 17,500 | 63,196 | 43,123 |
| ජූනි .. | 3,602 | 53,486 | 17,700 | 156,981 | — |
| ජූලි .. | 59 | 30,000 | 11,500 | 188,424 | 37,300 |
| අගෝස්තු .. | 69 | 55,730 | 37,070 | 157,451 | 41,462 |
| සැප්තැම්බර් .. | 35 | 56,000 | 60,026 | 31,450 | 36,037 |
| ඔක්තෝබර් .. | 46 | — | 23,235 | 315,504 | 33,280 |
| නොවැම්බර් .. | 19 | 60,000 | 10,003 | 159,086 | 11,180 |
| දෙසැම්බර් .. | 35 | 44,444 | 27,300 | 63,928 | 26,875 |
| එකතුව (අ) (ආ) .. | 38,448 | 571,190 | 263,367 | 1,733,557 | 327,625 |

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ගලපන ලද.

(ආ) පසුව කරන ලද ගැලපීම් හේතුවෙන් මාසික දත්තයන්ගේ එකතුව වාර්ෂික මුළු එකතුවට සමාන නොවිය හැකිය.

රේගුව විසින් ගෙවීම් මාධ්‍යය අනුව ආනයන වර්ග නොකිරීම නිසා විදේශ ආධාර යොදා ගනිමින් සිදු කළ ආනයන සම්බන්ධව වෙන වෙනම වාර්තා නොමැත. කෙසේවුව ද විදේශ ආධාර ලැබීම් මත වූ සංඛ්‍යා පදනම් කරගෙන ආධාර ආනයනයන් දළ වශයෙන් ඇස්තමේන්තු කිරීමට පුළුවන. මෙම පදනම මත 1984 සඳහා ආධාර ආනයනයන් රුපියල් 1,031 කෝටි 90 ලක්ෂයක් (විගැහි 39 කෝටි 60 ලක්ෂයක්) ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, 1983 හා සැසඳීමේදී එය රුපියල් 955 කෝටි 90 ලක්ෂයක් (විගැහි 37 කෝටි 90 ලක්ෂයක්) විය. එහෙයින්, මුළු ආනයන ප්‍රමාණය 1983 දී වූ සියයට 21 සිට 1984 දී සියයට 22 දක්වා ඉහළ නැඟුණි.

**විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය**

1977 වසරේදී හඳුන්වා දෙනු ලැබූ විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති මාලාව අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, 1984 වසර තුළ විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියෙහි සැළකිය යුතු වෙනසක් දක්නට නොවීය. එසේම, වැඩි කොටසක් ආනයන පාලනයෙන් තොරව පැවති අතර, සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන අපනයනයන් වර්ධනය කිරීම මූලික ප්‍රයත්නය විය.

අපනයනයන්ගේ විශාල වර්ධනය හා ආනයන වර්ධනය හීනවීම මෙම ප්‍රතිපත්තියෙහි සාර්ථකත්වය පැහැදිලි කරයි. ආනයන සම්බන්ධයෙන් සලකා බලන විට විශේෂයෙන් ම අත්‍යාවශ්‍ය නොවන ආනයනයන් සීමා කිරීමේ මූල්‍ය ප්‍රතිපත්තීන් නිසියාකාරව බලපෑ බවට සැකයක් නැත. අපනයන අංශයේ සමස්ථ ක්‍රියාකාරිත්වය දිරිගන්වන සුළු වූ අතර, 1984 වසර තුළ කෘෂිකාර්මික අපනයන හැරුණුවිට අනෙකුත් අපනයනයන්ට බලපෑ ව්‍යුහාත්මක වෙනස්කම් සමහරක් දක්නට ලැබුණි. එසේ වුවත්, රෙදිපිළි හා ඇඟලුම් හා වෙනත් කාර්මික භාණ්ඩ යන දෙවර්ගයෙහිම, අපනයනයන්හි විශාල වැඩිවීම් වාර්තා කෙරුණි. කෙසේ වෙතත් සුළු කෘෂිකාර්මික හා මැණික් අපනයනයන් වැනි වර්ධනය කළ හැකි ක්ෂේත්‍රයන්හි වූ අපනයනයන්, වෙනස්වීමකින් තොරව එම මට්ටමේම පැවතුණි. එනිසා මෙම අංශයන් ක්‍රමවත් කිරීම සඳහා ප්‍රතිපත්ති යොමු කරවීමේ හදිසි අවශ්‍යතාවය පැහැදිළිව පෙනීයයි.

පාරිභෝජනය හා ආයෝජනය යන දෙඅංශය සඳහාම භාණ්ඩ හා සේවාවන්ගේ සුලභතාවය සහතික කිරීම විවෘත ආර්ථික ක්‍රමයක ආනයන ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වේ. අන්තර් භාණ්ඩ කාණ්ඩයෙහි වර්ධනය සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයෙහි පහත වැටීම තුළින් උසස් මට්ටමක සම්පත් බෙදාහැරීමක් සඳහා ප්‍රතිපත්තීන් සහාය වූ ආකාරය සටහන් කරයි. මිළ ස්ථායීතාවය සහ ඉලක්ක කරගත් සැබෑ වර්ධනයක් ලබා ගැනීම සඳහා ප්‍රමුඛතා අංශ වෙනුවෙන් අවශ්‍ය මට්ටමට, තිබෙන අරමුදල් ගලායාමට සැලැස්වීමෙන්, මූල්‍ය ප්‍රතිපත්තිය විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියට සහාය වූ බව පෙනේ. විදේශ වෙළඳාම කෙරෙහි බලපැවැත්වූ මූල්‍ය ප්‍රතිපත්තීන් පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් මෙම වාර්තාවෙහි මුදල් හා බැංකු පරිච්ඡේදයෙහි දක්වා ඇත.

අපනයන වර්ධන ව්‍යාපාරයේ ප්‍රධාන ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (ශ්‍රී.ලං.අ.ස.ම.) අපනයන ප්‍රසාරණය සහ එහි ව්‍යුහාත්මක වෙනස්කම් අරමුණු කරගනිමින් අපනයනිකයන්ට සානුබල සැපයීමේ කර්තව්‍යය දිගටම කරගෙන යන ලදී. අපනයන සංවර්ධන අමාත්‍ය සභාවේ මෙහෙයවීම යටතේ ශ්‍රී.ලං.අ.ස. මණ්ඩලය අපනයන සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වග කිවයුතු විය. ජාතික සංවර්ධන වැඩ පිළිවෙළ වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, ශ්‍රී.ලං.අ.ස. මණ්ඩලය ක්‍රියාකාරී පාලන කමිටු හයක් පිහිටුවීමට පියවර ගන්නා ලදී. අපනයන අංශයට සම්බන්ධ බදු සහන පිළිබඳව නිර්දේශයන් කීපයක්ම මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද අතර, පසුව එම නිර්දේශයන් 1984 අප්‍රේල් මාසයේදී සංශෝධිත දේශීය ආදායම් පනතටද ඇතුළු කරන ලදී. විනිමය

අනුපාතික වෙනස්වීම් හේතුවෙන් පීඩාවට පත් අපනයනිකයින්ට සහන සැපයීම්වස්, අපනයන සංවර්ධන දීමනා ක්‍රමය යටතේ පියවර ගන්නා ලදී. සහන කොන්දේසි යටතේ, අපනයනිකයින්ට මැදි හා දිගුකාලීන මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා ද මණ්ඩලය දිගටම සහාය විය.

1984 වසර තුළද, ග්‍රාමීය මට්ටමෙන් අපනයන භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ, අපනයන නිෂ්පාදන ගම්මාන ක්‍රියාත්මක විය. මෙම අ.නි.ග. වල විශේෂයෙන් ම දේශීය වශයෙන් එකතුවූ වටිනාකම වැඩි භාණ්ඩ අපනයනය සඳහා ග්‍රාමීය නිෂ්පාදකයන් පුහුණු කිරීම මෙන්ම, සංවිධානය කිරීම ද කරන ලදී. මුළු අපනයන නිෂ්පාදන ගම්මාන ගණන 25 ක් බවට පත් කරමින් 1984 දී අ.නි.ග. 13 ක් අලුතින් ආරම්භ කරන ලදී.

විවරණයට භාජනය වන වසර තුළ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (ශ්‍රී.ලං.අ.ණ.ර.ස.) අපනයන ණය රක්ෂණය සහ ආවරණය තුළින් අපනයනිකයින්ට දිගටම සහාය විය. මෙම ආවරණයන්, අපනයනයට පෙර, පසු සහ අපනයන වර්ධන වශයෙන් තුන් ආකාරයකට ක්‍රියාත්මක විය.

බලපත්‍ර පාලනයෙහි වූ සුළු වෙනස්කම් හැරුණු විට 1984 වසර තුළ, අපනයන සහ ආනයන පාලන ප්‍රතිපත්තියෙහි වැදගත් වෙනස්වීම් දක්නට නොලැබුණි. මේ අතර, සීනි රටඉඳි සහ ලොකු ඇනු ආනයන බලපත්‍ර ක්‍රමයෙන් නිදහස් කෙරුණු අතර, මුහුදු යාත්‍රා (උපකරණ) (අශ්ව බල 25 ට වැඩි), නැවත පුරවන ලද ටයර්, දිලීර නාශක, වල් පැල නාශක, කෘමි නාශක සහ සමහරක් කෘත්‍රිම කෙඳි බලපත්‍ර පාලන යටතට ගන්නා ලදී.

සම්පූර්ණ වශයෙන් අපනයනය කිරීම සඳහා මිශ්‍ර කිරීම, ඇසිරීම සහ මළු තේ නිෂ්පාදනය සඳහා ආනයනය කරන ලද තේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සමහරක් පරිපාලන රෙගුලාසි වලට යටත්ව නිදහස්ව පැවතුණි. 1984 වසරේදී, මෙක්සිකෝව හැරුණු විට අනෙකුත් රටවලට අපනයනය කරන ලද කුරුඳු කූරු සහ කුරුඳු පොතු නිදහස්ව පැවතුණි. එසේම සෑම අපනයන භාණ්ඩයක්ම පාලනයෙන් තොරව නිදහස්ව පැවතුණි. කෙසේ වෙතත්, අපනයනික ද්‍රව්‍ය සුළු ප්‍රමාණයක් දිගටම පෙර අපනයන ප්‍රමිති පරීක්ෂණයන්ට යටත්ව පැවතුණි.

1984 වසර තුළ ආයෝජනය සඳහා සානුබල සැපයීම වැඩි කිරීම හා නිෂ්පාදකයින්ගේ ලාභාන්තරය වැඩි කිරීමේ අභිලාෂයෙන් අපනයන බදු සංශෝධනය කරනු ලැබිය. ශ්‍රී ලංකා තේ අනෙකුත් අපනයනිකයින් අතර වඩාත් තරගකාරී කිරීම සඳහා මෙන්ම දේශීය නිෂ්පාදකයින්ගේ ලාභාන්තරය වැඩි කිරීමේ පරමාර්ථයෙන් 1984 දී තේ අපනයන බද්ද අඩු කරන ලදී. මිළ වැඩිවන අවස්ථාවලදී අපනයන බදු වලින් එකතුවන අමතර ආදායම්, මිළ අඩුවන අවස්ථා වලදී නිෂ්පාදකයින්ට සහන සැළසීම්වස් රජයේ අයවැය යෝජනාවලින් ස්ථායීකරණ අරමුදලක් පිහිටුවීමේ වැදගත් කමද යෝජනා කරන ලදී.

ජාත්‍යන්තර මිළ පහත වැටීම හා රබර් කර්මාන්තයේ නිෂ්පාදන මිළ ඉහළ යාම මත රබර් අපනයන බදු ද පහත හෙළන ලදී. රබර් නිෂ්පාදකයින්ට වැඩි දුරටත් සහන සලසනුවස්, අනුක්‍රමික පරිමාණ බදු ක්‍රමයේ ගිවිසගත් මිළ දු.ගැ.දු.රො. නො. 1 සිට දු.ගැ.දු.රො. නො. 2 දක්වා මාරු කරන ලදී.

ජාත්‍යන්තර මිළ වෙනස්වීම් වලට ස්වයංක්‍රියව අනුකූලතාවය දක්වනු වස්, සියළුම පොල් මද නිෂ්පාදිත සඳහා වූ අනුක්‍රමික පරිමාන බදු ක්‍රමය දිගටම ක්‍රියාත්මක විය. කෙසේ වෙතත් බදු වලින් නිදහස් පොල් අවම මිළ 1984 නොවැම්බර් මාසයේ දී මෙට්‍රික් ටොන් 1 ක් රුපියල් 13,100 සිට රුපියල් 20,000 දක්වා ඉහළ දමන ලද අතර, අවම මිළ අතිරික්තය සියයට 50 ක බදු අනුපාතිකයකට යටත් කරන ලදී. තේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ආකාරයෙන් පොල්

සම්බන්ධයෙන් ද ස්ථායීකරණ අරමුදලක් පිහිටුවීමට රජය අදහස් කරන ලදී. 1984 දෙසැම්බර් මාසයේදී පොල්තෙල් සම්බන්ධ අවම මිළ ක්‍රමය ඉවත් කරන ලද අතර, කපාපු පොල් සම්බන්ධ අවම මිළ වසර තුළ දෙවරක් ඉහළ දැමීමට ක්‍රියා කරන ලදී.

ජනාධිපති තීරුබදු කොමිසම මගින් සමස්ථ බදු ව්‍යුහය විවරණයට ලක් කරන ලදී. නිෂ්පාදකයින්ට සානුබල සැපයීම සහ දේශීය කර්මාන්තයනට ප්‍රමාණවත් ආරක්ෂණයක් සැපයීම කොමිසම මගින් නිර්දේශිත බදු සංශෝධනයන්ගේ අරමුණ විය. එසේද වුවත්, අන්තර් භාණ්ඩ භාණ්ඩයෙහි සමහර ශීර්ෂ සඳහා ආනයන බදු සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලද අතර (ප්‍රධාන වශයෙන් පොහොර, සිමෙන්ති, ක්ලින්කර සහ රසායන ද්‍රව්‍ය) සමහරක් ආයෝජන භාණ්ඩ (යන්ත්‍ර සූත්‍ර, මෝටර් රථ, යකඩ හා වානේ සහ වෙනත්) සහ අන්තර් භාණ්ඩ ආනයනයන්ගේ බදු සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කරන ලදී. ඖෂධ, ළදරු කිරි ආහාර, මුද්‍රිත පොත් හා වෙනත් පාරිභෝගික භාණ්ඩයන්ගේ බදු ද ඉවත් කරන ලදී. දේශීය කර්මාන්ත සමග වැඩි තරඟකාරිත්වයකින් යුත් භාණ්ඩ (සම්පූර්ණ මේද සහිත කිරිපිටි, සහල්, සීනි, සනීපාරක්ෂක උපකරණ, සහ වෙනත්) සඳහා ඉහළ බදු නිර්දේශ කරන ලදී. ජනාධිපති තීරුබදු කොමිසමේ නිර්දේශ මත වඩාත් පලදායී ආනයන බදු 1984 නොවැම්බර් මාසයේදී හඳුන්වා දෙනු ලැබීය.

1981 වසරේදී ආනයනයන් සඳහා ද ව්‍යාප්ත කරනු ලැබූ පිරිවැටුම් බදු 1984 දී ද දිගටම ක්‍රියාත්මක විය. නිෂ්පාදනයෙන් සියයට 50 ක් හෝ එයට වැඩි ප්‍රමාණයක් අපනයනය කරනු ලබන කර්මාන්තයන්ගේ පාවිච්චිය සඳහා ආනයනය කරනු ලැබූ පෙට්ටිවල බහාලූ යන්ත්‍ර සූත්‍ර සඳහා පිරිවැටුම් බදු ඉවත් කිරීම, කැපී පෙනෙන සුළු වෙනසකි.

ජාත්‍යන්තර ස්වාභාවික රබර් ගිවිසුමෙහි සහ ජාත්‍යන්තර කෝපි ගිවිසුමෙහි සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකාව දිගටම ක්‍රියා කරන ලද අතර, වසර තුළදී තේ ගිවිසුමක් සම්බන්ධ සාකච්ඡාවන්ට ද සහභාගි විය.

## අභ්‍යන්තර වෙළෙඳාම

පසුගිය වසර කිහිපය තුළ අනුගමනය කරන ලද අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තිය අනුව යමින්, මිළ යන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වයේ විකෘති කිරීම් වැලැක්වීමට වෙළෙඳපොළෙහි මැදිහත්වීම අවම කරන ලද අතර, අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයන් සාධාරණ මිළ ගණන් වලට ලබා දීම අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තියෙහි අරමුණ විය. කෙසේ වෙතත්, සාධාරණ තරගකාරිත්වයක් සහ පිළිගත හැකි වෙළෙඳ සමාචාරයන් පවත්වා ගැනීමට කිසියම් ප්‍රමාණයක පාලනමය ආයතනික සංවිධානයක් තව දුරටත් පවත්වාගෙන යන ලදී. මේ සඳහා අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව පාරිභෝගික ආරක්ෂක පනත, මිළ පාලන පනත සහ කිරුම් හා මිනුම් ආඥ පනත ක්‍රියාත්මක කිරීමෙන් ස්වකීය කර්තව්‍යයන් විධිමත් කිරීමේ කටයුතු වල නිරත විය.

පාරිභෝගිකයන්ගේ අවබෝධය වැඩි කිරීම සඳහා මහ පොළ වෙළෙඳ සල්පිල් සහ පාරිභෝගික සමිති සංවිධානය කිරීමට අවධානය යොමු කරන ලදී. වසර තුළ අළුත් පාරිභෝගික සමිති 600 ක් පිහිටවූ අතර රටෙහි විවිධ ප්‍රදේශයන්හි මහ පොළ වෙළෙඳ සල්පිල් 18 ක් පවත්වන ලදී.

තිරිඟු පිටි, පාන් සහ මයිසූර් පරිප්පු 1984 වසරෙහි ද මිළ පාලනයන් යටතේම පැවතිණි. ජාතික මිළ කොමිසම විසින් 1984 වසරෙහිදී මිළ පුනරික්ෂණයන් 109 ක් කළ අතර, 1983 වසරෙහි කරනු ලැබූ මිළ පරීක්ෂණයන් ගණන 76 ක් විය. ඒකාධිකාරීන්, සංගත සහ තරග කාරිත්වයට අහිතකර විෂමාචාරයන් පාලනය කිරීමට වගකීම ලැබෙනු සඳහා කොමිසමෙහි විෂය ක්ෂේත්‍රය පුළුල් කිරීමට ව්‍යවස්ථා කෙටුම්පතක් 1984 වසර තුළ සකස් කරන ලදී.

නව වෙළෙඳ තත්ත්වයන් යටතේ වෙළෙඳාමෙහි රැඳී සිටීම සඳහා රාජ්‍ය අංශයෙහි වෙළෙඳ ආයතන පෞද්ගලික අංශය සමග තව දුරටත් තරග කරන ලදී. රාජ්‍ය වෙළෙඳ ආයතනයන් නව ව්‍යාපාරික කටයුතු වලට යොමු වුව ද, පෞද්ගලික අංශයෙන් එල්ලවූ තරගය නිසා තම කටයුතු වල පහත වැටීමක් ඇතිවූ බව අවබෝධ කරගත්හ. සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව සහ අලෙවි දෙපාර්තමේන්තුව, පාරිභෝගික මිළ ගණන්වල ස්ථාවරත්වය පවත්වා ගැනීමටත් අත්‍යාවශ්‍ය භාණ්ඩ වල සුලභතාවය සහ සාධාරණව බෙදාහැරීම සහතික කිරීමෙහිලා වැදගත් වූ ආයතන විය.

විශේෂයෙන්ම අලෙවි දෙපාර්තමේන්තුව නැවත ප්‍රතිසංවිධානය කිරීම, එළවළු ඇතුළු පාරිභෝගික අයිතමයන්ගේ මිළ ගණන් අඩු කිරීමට සැළකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. 1984 දී, පාරිභෝගික මිළ ගණන් අඩු කිරීම සඳහා අලෙවි දෙපාර්තමේන්තුව බොහෝ දුරට ක්‍රියාශීලී කාර්යභාරයක් දැරීය. සමූපකාර තොග වෙළෙඳ ආයතනයේ සම්භාර තොග හැසිරවීමද, මූලික පාරිභෝගික ද්‍රව්‍යයන් සුලභව පවත්වා ගැනීමට උපකාරී වූ අතර, අත්‍යවශ්‍ය භාණ්ඩයන්ගේ මිළ ගණන් ස්ථායීව පවත්වා ගැනීමට ද ඉවහල් විය.

අභ්‍යන්තර වෙළෙඳාමෙහි සමූපකාර සමිතිවලට හිමි කාර්යභාරය ආහාර මුද්දර ක්‍රමය යටතේ සහල්, පිටි, සීනි වැනි මූලික ආහාර ද්‍රව්‍යය සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීම සහතික කරන්නක් බවට පත්වී ඇත. එහෙයින් ඔවුන්ගේ ලාභ තවදුරටත් අඩුව පැවතිණි. කෙසේ වෙතත්, අත්‍යාවශ්‍ය භාණ්ඩ කාර්යක්ෂම ලෙස රට පුරා බෙදා හැරීම හදිසි අවශ්‍යතාවයක් බවට පත්වූ අර්බුදයන් හෝ අභ්‍යන්තර කැළඹීම් පැවති කාල පරිච්ඡේද වලදී සමූපකාර සමිතිවල අත්‍යවශ්‍යතාවය පැහැදිලි විය. එහෙයින් මූල්‍ය පහසුකම් හෝ වෙනත් පහසුකම් ලබා දීම මගින් සමූපකාර සමිතිවල ආර්ථිකමය රඳා පැවැත්ම තහවුරු කිරීම අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තියෙහි අරමුණ විය යුතු වේ.

## සංචාරක කර්මාන්තය

සංචාරක කර්මාන්තයෙහි 1983 දී දක්නට ලැබුනු ක්‍රියාකාරී පසුබෑම 1984 දී තරමක් දුරට සමනය වී ගිය බව දක්නට ලැබේ. සංචාරක පැමිණීම්, සංචාරක දින ගණන්, (රාත්‍රී) කාමර උපයෝගීකරණය සහ සංචාරක ඉපැයීම් වැනි මූලික ක්‍රියාකාරීත්වය පිළිබඳ දර්ශකයන් දෙස බැලීමේදී සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට යොමු වීමක් දක්නට ලැබුනත් එහි ක්‍රියාකාරීත්වයෙහි පැවතියේ 1982 සහ 1983 යන දෙවර්ෂයෙහි පැවති තත්ත්වයට වඩා පහත් තත්ත්වයකි. බටහිර රටවල උදාවූ යහපත් ආර්ථික තත්ත්වය හේතුකොට ගෙන 1984 අග භාගයේදී සංචාරක පැමිණීම් අංශයෙහි වැඩිවන උපනතියක් ඇති විය. කෙසේ වෙතත්, ඉන්දියානු රජය විසින්, දෙනු ලැබූ ගමන් බඩු සඳහා වූ තීරු බදු නිදහස් දීමනාව කෙරෙහි සීමාවන් පැනවීමේ හේතුවෙන් ඉන්දියාවේ සිට පැමිණෙන සංචාරකයින්ගේ සංඛ්‍යාව තියුණු ලෙස පහත වැටුණි.

1982 වසරට වඩා සියයට 22 ක හා 1983 වසරට වඩා සියයට 6 ක අඩු වීමක් පෙන්වමින් 1984 දී මෙරටට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 3,17,734 ක් විය. බටහිර යුරෝපය, උතුරු ඇමෙරිකාව හා ඕස්ට්‍රලේෂියාව යන රටවලින් පැමිණි සංචාරකයින්ගේ ගණන 1983 පැවති මට්ටමට වඩා වැඩි විය. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංචාරක වෙළෙඳපොළ වන බටහිර යුරෝපයෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 1984 දී 1,91,070 ක් වූ අතර, සියයට 8 ක වැඩි වීමක් ඉන් පිළිබිඹු වෙයි. එමෙන්ම, අනෙකුත් ප්‍රධාන සංචාරක වෙළෙඳපොළවල් වූ උතුරු ඇමෙරිකාව හා ඔස්ට්‍රලේෂියාවෙන් පැමිණි සංඛ්‍යාවන් පිළිවෙළින් 15,020 ක් හා 11,970 ක් විය. මෙය ඉකුත් වර්ෂයේ මෙම කලාපවලින් පැමිණි සංඛ්‍යාවට වඩා පිළිවෙළින් සියයට 2 ක සහ සියයට 13 ක වැඩි වීමක් පෙන්වයි. මීට ප්‍රතිවිරුද්ධ ලෙස ඉන්දියාවෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව විශාල වශයෙන් පහත වැටීමේ හේතුවෙන්, ආසියානු කලාපයෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සියයට 28 කින් පහත වැටුණි. 1984 දී මෙරටට පැමිණි